# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,921/4 — 1970 සැප්තැම්බර් 2 වැනි බදාදා — 1970.9.2

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)

## පළාත් පාලන දැන්වීම්

ඇල්. ඩි.—බී. 29/70.

### නගර සභා ආඥාපනත

### 184 වැනි වගන්තිය යටතේ ආඥාව

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 184 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමති, ෆිලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, බලංගොඩ නගර සභාවේ සභාපති මොහොමඩ් ලෙබ්බෙ රික්කාර් අබූසාලි මහතා සම්බන්ධයෙන්—

(අ) එකී ආඥාපනතින් පැවරී ඇති රාජකාරි කටයුතු ඉටු කිරීම ඔහු කැමතින් පැහැර හැරීම හා එම රාජකාරි කටයුතු ඉටු කිරීමේදී ලා විපරීතාචාර යෙන් කටයුතු කිරීම,

(ආ) අදක්ෂතාවය සහ අයථා පාලනය, හා

(ඇ) එකී ආඥාපනතින් පැවරී ඇති බලතල අයථා අන්දමින් පරිහරණය කිරීම,

යන මේවා ඔප්පු වන ප්‍රමාණවත් සාක්ෂි තිබෙන බවට මා සෑහීමට පත්ව සිටින බැවින් මෙ ආඥාවෙන් එකී මොහොමඩ් ලෙබ්බෙ රික්කාර් අබූසාලි මහතා එකී නගර සභාවේ සභාපති ධුරයෙන් ඉවත් කරමි.

ෆී. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති.

1970 සැප්තැම්බර් මස 2 වැනි දින,
කොළඹ දී ය.

9–389


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

602/1——පේ 16666—5,525 (70/9)